# යුද්ධයේ දඬු අඬුව - ගාමිණී වියන්ගොඩ (රාවය)

මේ වන විට, යුද්ධය පිළිබඳ විනාශකාරී සාමූහික මතයකට දකුණු ලංකාව අවතීර්ණ වෙමින් සිටින සෙයක් පෙනෙන්ට තිබේ. යුද්ධයට විරුද්ධ ව පෙනී සිටීම ජාතිද්‍රෝහී ක්‍රියාවක් වශයෙන් සැලකෙන මට්ටමට ඒ මතවාදය අද දකුණු සමාජයේ අධිකාරී බලයක් උසුලයි. රජයේ හමුදා විසින් විටින් විට උතුරේ අත්කර ගන්නා බිම් මට්ටමේ ජයග්‍රහණයන් විසින් මේ මතවාදය බලගන්වයි. තිරිහන් කරයි. එහි ආසන්නත ම කඩඉම වුණේ පුනරින් ය. ඒ වෙනුවෙන්, දකුණු ලංකාව සතියක් පුරා මධුපැන් බීවේ ය.

ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ඉදිරිපත් කිරීමේ ප්‍රාරම්භක පියවරක් යැයි කියමින් ආරම්භ කෙරුණු වත්මන් යුද්ධයේ මේ අදියර අවසන් වෙනු ඇත්තේ, යුද්ධයේ බිම් මට්ටමේ ජයග්‍රහණයන් ම, ප්‍රශ්නයට අවසාන විසඳුම වශයෙන් ද ආදේශ කරමිනි. අත්කර ගනිමින් තිබෙති යි කියන ජයග්‍රහණ ඒ තරමට ආස්වාදනීය ය. මේ ආස්වාදය, මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑමට වෙනස් නැති බව හෙට දවසට උපුටා ගැනීමක් සඳහා දැන් ලියා තැබීමට කැමැත්තෙමි. මන්ද යත්, " උන්ගේ" විනාශය අරමුණු කොට අත්කර ගන්නා "අපේ" යුද ජයග්‍රහණ තුළ උන්ගේත් අපගේත් අනාගත විනාශයන් පෙකෙණිවැළෙන් ගැට ගැසී ඇති බැවිනි. වන්නියේ ගස්කොළන් යට ජීවත් වන ලක්ෂ ගණන් දෙමළ ජනයා "අපේ" ජයග්‍රහණයෙන් උදම් වෙති'යි සිතීමට තරම් අප නියාළු ද? සතියක් පුරා අප ජය පැන් බොන විට ඒ ගස් යට ජීවත් වන මිනිසුන් අප ගැන කුමක් සිතන්නට ඇත් ද? අපේ මධු විතට හිලව්වක් වශයෙන් ඔවුන්ට තිබුණේ, ඉන්දියාව එවූ වියළි ආහාර සලාක පැකට්ටුවකි. මේ නිසා ම, දේශපාලන විසඳුමක අනාගත පරමාදර්ශය යටතේ වර්තමාන යුද්ධය වෙනුවෙන් පෙනී සිටින ඇතැම් ලිබරල්වාදීන් ගේ මනෝරාජික අභිලාසය සහ නග්න යුදවාදීන් ගේ මතවාදීමය ආස්ථානය අතර, කිසි යම් හෝ වෙනසක් ආරම්භයේ දී හෝ තිබුණේ නම්, එය පවා අහෝසි වීමට යුද්ධය තුළ කරුණු යෙදෙනු නො අනුමාන ය.

මේ සම්බන්ධයෙන් මෑත කාලීන පූර්වාදර්ශය සපයන්නේ නැගෙනහිරිනි. එම පළාත යුදමය වශයෙන් 'නිදහස්' කර ගැනීම සහ එම නිදහස 'ප්‍රජාතන්ත්‍රවාදී ව' අර්ථවත් කිරීම සඳහා පළාත් සභා මැතිවරණ ද පවත්වා අවසන් වීමෙන් පසු අද නැගෙනහිර තත්ත්වය වටහා ගැනීම සඳහා ජීවමාන සාක්ෂි සපයන්නේ එම පළාතේ මහ ඇමතිවරයා ම ය. ගිය සතියේ ජනාධිපතිවරයා වෙත ඔහු පෙත්සමක් ඉදිරිපත් කළ බව මාධ්‍ය වාර්තා කෙළේ ය. ඉන් කියැවුණේ, නැගෙනහිර දෛනික මට්ටමෙන් සිදු වන ඝාතන රැල්ල පසු පස විශේෂ සේවා බලකාය සිටින බව යි. ඊයේ (2) වන විට සර්ව පාක්ෂික සමුළුව ඔවුන් විසින්, එ නම් පිල්ලෙයාන් විසින් වර්ජනය කර ඇත. මේ අතර, කරුණා අම්මාන් විසින් පත් කර එවූ සාමාජිකයන් ව සර්ව පාක්ෂික සමුළුව බාරගෙන නැත. කොළඹ සිටින කරුණා අම්මාන්ට ඔහු විසින් ම කලකට ඉහත දී 'නිදහස්' කර ගත් නැගෙනහිරට අද වන විට යාමට බැරි

ය. අනිත් අතට, ප්‍රජාතාන්ත්‍රික පළාත් සභාවකින් බෞතීස්ම කෙරුණු පිල්ලෙයාන්ට ඒ 'නිදහස්' පෙදෙසේ සිට අප ජීවත් වන කලාපයට සැකෙන් බියෙන් තොර ව පැමිණීමේ හැකියාවක් නැත. පිල්ලෙයාන් වෙනුවෙන් නැගෙනහිර නිදහස් කර දුන් ආණ්ඩුවට, බස්නාහිර දී එම පිල්ලෙයාන් ගේ හිතෛෂී දේශපාලන සගයා ගේ ජීවිතය ආරක්ෂා කර දීමට පුළුවන් කමක් නො තිබුණු බැවිනි.

මේ වනාහී 'නිදහස්' කර ගත් නැගෙනහිර පවතින අද තත්ත්වය යි. එ සේ වන විට, 'නිදහස්' කර ගැනීමට අපේක්ෂා කරන උතුරේ තත්ත්වය කුමක් ද?

ලබන වසරේ යුද්ධය වෙනුවෙන් වෙන් කොට ඇති මුදල රුපියල් බිලියන 170 කි. එ නම්, රුපියල් කෝටි 17,000 කි. ආණ්ඩුව පවසන පරිදි, තව ඉතිරි ව ඇත්තේ එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් 5000 කි. ඒ අනුව, එක කොටි සාමාජිකයෙකු ඝාතනය කිරීම සඳහා රුපියල් මිලියන 34 ක් හෙවත් රුපියල් තුන් කෝටි හතළිස් ලක්ෂයක් වැය කිරීමට ආණ්ඩුව සූදානම් ය.

මෙ වැනි ඝෝර චිත්‍රයක් පැහැදිලි ව පෙනෙන්ට තිබිය දී, ආණ්ඩුව කරන මේ යුද්ධය බොරුවක්, වංචාවක් වශයෙන් හුවා දැක්වීමට එක්සත් ජාතික පක්ෂය ඇතුළු විවිධ විරුද්ධවාදී කණ්ඩායම් දරන උත්සාහය, එක පැත්තකින් කුහක ය. අනිත් පැත්තෙන්, ඉතා භයානක ය. අද රජයේ හමුදා මීට පෙර කිසි රජයකින් නො ලද ආකාරයේ නිදහසක් යුද්ධයේ ඕනෑඑපාකම් වෙනුවෙන් භුක්ති විඳින බව පැහැදිලි ව පෙනෙන්ට තිබේ. සමාජයේ සෑම අංශයක් කෙරෙහි ම, විශේෂයෙන් මාධ්‍ය භාවිතය සහ සංස්කෘතික අවකාශයන් කෙරෙහි බලපෑම් කිරීමට පවා හමුදා මතවාදයට ඉඩ ලැබී තිබේ. අද වන විට අපේ ජීවිත දෛනික මට්ටමකින් ම හමුදාකරණයට ලක් වෙමින් තිබෙන්නේ පෙර නො වූ විරූ ආකාරයෙනි. අනිත් අතට, දීර්ඝ කාලයක් තිස්සේ අපරාජිත භාවයක් පෙන්නුම් කළ කොටි සංවිධානය විවිධ පෙරමුණුවලින් යුදමය වශයෙන් පසුබැස්වීමේ සාර්ථකත්වයක් ද හමුදා මෙහෙයුම් මගින් පෙන්නුම් කොට තිබේ. ඒ අනුව බලන කල, ආණ්ඩුව බොරුවට යුද්ධ කරති යි කීම දේශපාලනික වශයෙන් කෙටි කාලීන පටු අපේක්ෂා ඉෂ්ට කර ගැනීමේ මුවහත් අවියක් විය හැකි වුවත්, කටුක සත්‍යයට නම් කිට්ටු නැති බව කිව යුතු ය. බොරුවට යුද්ධ කරති යි කීම භයානක වන්නේ ඇයි? ඉහත සඳහන් සකල කළමනා සහ විනාශයන් මධ්‍යයේ පවා සිදු වන්නේ හිතාමතා කරන බොරුවක් නම්, "ඇත්තට යුද්ධ කිරීම" තව දුරටත් අනාගතයට ඉතිරි කෙරෙන උරුමයක් වනවා පමණක් නො ව, එය මීටත් වඩා විනාශකාරී ද වනු ඇත. අනිත් අතට, මෙ තරම් විනාශයකින් පසු ව පවා, මේ මිනිසුන් විසින් ඔප්පු කිරීමට වළිකනු ඇත්තේ, යුද්ධයේ අවසාන විග්‍රහය තුළ ඇති වන අසාර්ථකත්වය පුද්ගලයන් වෙත සහ යුද සැලසුම් තුළ පැවති අසාර්ථකත්වයන් වෙත බැර කිරීමට ය. එ විට, විසඳුම් ක්‍රියා මාර්ගයක් වශයෙන් 'සැබෑ යුද්ධයක' අවශ්‍යතාව ඉදිරි පරම්පරාවටත් වලංගු වනු ඇත. මහින්ද රාජපක්ෂ = චම්පික රණවක ආණ්ඩුව 'බොරුවට යුද්ධ කරති' යි කීම භයානක වන්නේ එ බැවිනි.

සැබෑ සාමයක් සහ දේශපාලන විසඳුමක් වෙනුවෙන් අවංක ව පෙනී සිටින විරුද්ධ

පක්ෂයක් නම් කළ යුතු ව ඇත්තේ, පුනරින් අල්ලා ගන්නා විට රණ විරුවන්ට සුබ පැතීමත්, එම විරුවන් ම රණ බිමේ දී මියයාමේ දී එහි වගකීම ආණ්ඩුවට බැර කිරීමත් නො ව. පරාජයේ දී මෙන් ම ජයග්‍රහණයේ දී ද යුද්ධයේ නිරර්ථක භාවය දැකීමට තරම් අදීන වීම යි. ඒ සඳහා අනාගත දැක්මක් අවශ්‍ය කෙරේ. ජාතික ප්‍රශ්නයට යුද්ධය විසඳුමක් නො වන්නේ, එය 'හරියට' කරනවා ද, 'වැරදියට' කරනවා ද යන්න මත වත්, බිම් මට්ටමේ දී ජය ලබනවා ද පරාජය වනවා ද යන්න මත වත් නො ව, "යුද්ධය ම ප්‍රශ්නය වන නිසා" බව වටහා ගැනීම ඒ දැක්ම තුළ තිබිය යුතු පළමු කොන්දේසිය යි.

යම් හෙයකින් මේ ගැන අබමල් රේණුවක හෝ සැකයක් ඇත් නම්, පසු ගිය වසර කිහිපය තුළ ජෝර්ජ් බුෂ් දියත් කළ හමුදාමය විසඳුම ඉරාකය තුළ ක්‍රියාත්මක වී ඇති ආකාරයත්, ඒ මාර්ගයෙන් මේ වන විට ඉරාකය දිනා ඇති 'නිදහස' පිළිබඳ වාර්තාත් කියවා බැලීම යෙහෙකි. බරක් ඔබාමා ඇමරිකානු හමුදා ආපසු කැඳවීමට ප්‍රතිඥා දුන්නේ, බුෂ් 'වැරදියට යුද්ධ කළ' නිසා නො ව, යුදමය විසඳුම ම අසාර්ථක බව පිළිගැනීම නිසා ය.